# "ලාඉලාහ ඉල්ලල්ලාහ්" හි තේරුම

කතෘ:

**හම්මූද් බින් මුහම්මද් අල්ලාහිම්.**

පරිවර්තනය:

**මුහම්මද් සලීම්**

කැඳවීමේ හා සහයෝගි කාර්යාලය,
අල් බත්හා සමාජ ඒකකය
රියාද් - සවුදි අරේබියාව.

COOPERATIVE OFFICE FOR CALL AND GUIDANCE IN AL-BATHA
( UNDER THE SUPERVISION OF THE MINISTRY OF ISLAMIC AFFAIRS )
P.B.No 20824 - Riyadh 11465 K.S.A.
Tel. 4030251 - 4083406 FAX. 4059387

53

# "ලාඉලාහ ඉල්ලල්ලාහ්" හි තේරුම

කතෘ:
හමූද් බින් මුහම්මද් අල්ලාහිම්.

පරිවර්තනය:
මුහම්මද් සලීම්

කැඳවීමේ හා සහයෝගි කාර්යාලය,
අල් බත්හා සමාජ ඒකකය
රියාද් - සවුදි අරේබියාව.

**المكتب التعاوني للدعوة والإرشاد**
**وتوعية الجاليات في منطقة البطحاء**
تحت إشراف
**وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد**
ص . ب : ٢٠٨٢٤ الرياض : ١١٤٦٥
هاتف ٤٠٣٠٢٥١ – ١ – ٠٠٩٦٦
٤٠٣٠١٤٢
٤٠٣٤٥١٧
٤٠٣١٥٨٧
فاكس : ٤٠٥٩٣٨٧
هاتف وفاكس صالة المحاضرات بالبطحاء
٤٠٨٣٤٠٥ – ١ – ٠٠٩٦٦



COOPERATIVE OFFICE
FOR CALL AND GUIDANCE
IN AL-BATHA
UNDER THE SUPERVISION OF
MINISTRY OF ISLAMIC AFFAIRS.
ENDOWMENTS. PROPAGATION AND GUIDANCE
P.O.BOX : 20824 RIYADH: 11465
TEL: 00966-1-4030251
4034517
4031587
4030142
FAX: 4059387
Lecture hall. Tel. +Fax : 00966-1-4083405

# "ලාඉලාහ ඉල්ලල්ලාහ්"හි තේරුම

## හැඳින්වීම :

"ලාඉලාහ ඉල්ලල්ලාහ්" لا إله إلا الله නමවූ කෙටි වාක්‍යය මුස්ලිම හා කාfපිර් යන දෙදෙනා අතර වෙන්කර පෙන්වන විශ්වාසයේ ප්‍රධාන අංගයෙකි. මෙය ඉස්ලාමයේ පදනමවේ. විශ්වය, මිනිසා සහ ඔහුගේ ජීවිතය සම්බන්ධව සංකල්පයක් මෙයින් ලැබෙන්නේය. ලොව පහළවූ පළමු වක්තෘවූ නූහ් (අලෙයි) පටන් අවසාන වක්තෘවූ මුහම්මද් (සල්) තුමා, දක්වාවූ සෑම උත්තමයන්ගේ පණිවුඩය හා ප්‍රචාරය මෙම වාක්‍ය පදනම් කොට තිබුනි. අල්ලාහ් මෙසේ පවසයි.

**" මට මා හැර වෙන දෙවි කෙනෙක් නැත. එහෙයින් මටම නමදිනු නමවූ නියෝගය පහළ නොකර ඔබට පෙර කිසිම වක්තෘවරයෙක් අප නොඑවෙමු"**
**( අල්කුර්ආන් 21:25 )**

මෙලොව ඇති මානව සංහතිය, ජින් වර්ගයා හා අනිකුත් සෑම දෙයක්ම මවා ඇත්තේ අල්ලාහ්ට අවනතවී ඔහුට පමණක් වැඳුම පිදුම කර ජීවත්වීමටය. කරුණු මෙසේහෙයින් මෙම විශ්වයේ ඇති සෑමයක්ම මැවීම හා පාලනය අයිති අල්ලාහ්ට අවනතවෙයි. අල්ලාහ් සෑම වස්තුවක් ගැනම දන්නේය.

# "ලාඉලාහ ඉල්ලල්ලාහ්" මෙහි තේරුම

මෙම වාක්‍යය සංකල්ප දෙකකින් සමන්විතයි. එනම් එකක්: ප්‍රතික්ෂේප කිරීම. අනෙක: සහතික කිරීමය.

**පළමුවැ:**

විශ්වාසයේ සාක්ෂි දැරීම තුළින් ප්‍රශංසාව හා දේවත්වයේ උසස් ලක්ෂණ ඇති අල්ලාහ් හැර අන් සෑම කෙනෙක්ම, සෑම දෙයක්ම ප්‍රතික්ෂේප කරනු ඇත. අල්ලාහ් හැර මලායිකාවරු, (දේවදූතවරු) නබිවරු, අනෙක් මිනිසුන් ලොව ඇති පිළිම හා රාජ්‍ය පාලනයන්හි දේවත්වයක් නැති බවත් නැමදීමට සුදුස්සෝ නොවන බවත් කියනු ලැබේ. මෙහි ප්‍රතික්ෂේප කිරීම යනුවෙන් අදහස් කරන්නේ මෙවැනි දෙවියෝ නැති බව පමණක් නොව දෙවි කෙනෙකුට ම ආවේනිකවූ දේවත්වයේ ගුණාංගද ඔවුන්ට නැති බවය.

**දෙවනුව:**

විශ්වාසයේ සාක්ෂිය දෙවියන් එක්කෙනෙකු බවත්, එය අල්ලාහ් බවත්, දේවත්ත්‍ය ඔහුට පමණක් ඇති බවත් පිළිගැනීමය. එනම් යම් දාසයෙක් අල්ලාහ් පමණක් සත්‍ය දෙවියෙක්ය යන්න පිළිගෙන වෙන කාටත්, කුමන දෙයකටවත් නැමදීම නොකළ යුතු බවත් පිළිගත යුතුයි. මෙලෙස අපි අවනතවන, අපි නමදින අල්ලාහ්ගේ ගුණාංග නිසි ලෙස දැනගැනීම ඉතා වැදගත්ය.

1. **දේවත්වය:** අල්ලාහ් පමණය දෙවිකෙනෙකුවන්නෙ. ඔහු හැර වෙන දෙවිකෙනෙකු නොමැත. ඔහුගේ

දේවත්වයට අදාළ ගුණාංග ඔහුගේ බලය හා රාජ්‍ය බෙදාගන්නා වෙනත් සහකාරයන් නොමැත. ඔහුට කිසිදු අවශ්‍යතාවයක් නොමැත.

2. **සර්ව සම්පූර්ණත්වය:** අල්ලාහ් කිසිවෙකුගේ අවශ්‍යතාවයන් නොමැත්තෙකි. ඔහුට උදව් උපකාර කරන්නෙකු හෝ භාර්යාවක් හෝ පුතෙක් අවශ්‍ය නොවෙයි.

3. **ශක්තිය:** අල්ලාහ්ට යමක් කිරීමෙ සම්පූර්ණ ශක්තියක් ඇත. ඔහුගේ ශක්තිය හංග නොවෙයි. ඔහුට කැමැතිදෙයක් වෙහෙස මහන්සියෙන් හෝ කිසිවෙකුගේ උදව්වක් නොමැතිවම කරයි. ඔහු යමක් කිරීමට සිතන්නේනම් "කොරෙනු" (කුන්) යනු කියූ පමණින් එය ඒ ආකාරයෙන්ම කෙරෙන්නේය.

4. **අමරණීය ජීවිතය:** අල්ලාහ්ට නැතිවීමක් නැත. ඔහු සදාකාලිනය; ඔහු අල්කයියූම වෙයි.

5. **උද්‍යෝගී භාවය:** අල්ලාහ් කවදත් නොනිදයි. ඔහු අනවධානයෙන්ද නොසිටියි. නිදිමත ගතියක් හෝ නින්දක් ඔහුට නොමැත.

6. **සම්පූර්ණ ආධිපත්‍යය:** මුලු විශ්වයේම ඇතිදේ සියල්ලම අල්ලාහ්ට පමණක් අයිතියි.

7. **ඥානය:** මුළු විශ්වයේ ඇති සෑම දෙයක් ගැනම වූ ඥානය අල්ලාහ් සතුය. කුඩා කුඹියෙකු ගැනවූ දෙයක් වුවත් ඔහුගේ ඥානයෙන් පිටත යන්නේ නැත. ඔහු සැඟවුනු හා දෘශ්‍යමාන, අතීත, වර්තමාන හා අනාගත දේ පමණක්

නොව මිනිසාගේ සිතුවිලිද හොඳාකාරව දනියි.

8. **අභිමානය හා මහිමය:** අල්ලාහ්ගේ ශ්‍රේෂ්ටත්වය, මහිමය, ආධිපත්තිය වැනි දේවල්හි ඔහුට වඩා උත්තරීතර තවත් දෙයක් හෝ කෙනෙක් මෙම මිහිපිට නොමැත.

9. **කරුණාව හා ත්‍යාගශීලිභාවය:** අල්ලාහ් වැරදි නොකරන්නෙකි. අයුතු අන්දමින් වැරදි නොකළ තම වහලුවන්ට දඬුවම නොදෙයි. ඔහු තමාට අවනතවන්නාට ආදරය, කරුණාව දක්වයි. කවරෙක් පශ්චාත්තාපයට පත්වී සමාව අයැද සිටින්නේද ඔහුට සමාව දෙයි.

ඉහත සඳහන් ගුණාංග සියල්ලම අල්ලාහ්ට හැර වෙන කිසිවෙකුට නොමැත. ඔහු පමණක් වැඳුම, පිදුම ලැබිය යුත්තා වන්නේය. ඔහුමය අධිපතියා; බලවතා; ඥාණය ඇත්තා; පෙනෙන නොපෙනෙන සියල්ලක්ම දැනගැනීමේ ශක්තිය තිබෙන්නා; කරුණාවන්තයා; ත්‍යාගශීලි භාවයෙන් පරිපූරණත්වය ඇත්තා බව පිළිගත යුතුයි.

දේවත්වයේ මෙම ගුණාංග ඇති අල්ලාහ් මිනිසා අවනතවිය යුතු එකම ශ්‍රේෂ්ඨත්වයාවෙයි. නැවීම සියල්ලද ඔහුට පමණක් අවනතවෙයි. මෙම කරුණු නිසා, දේවත්වයේ උසස් ගුණාංග අල්ලාහ්ට හැර වෙන කිසි කෙනෙකුට නැති බවත් අල්ලාහ්ට පමණක් එම සියල්ල හිමි බවත් කලිමාවෙන් සඳහන් වෙයි. මෙයේ සඳහන් වන්නේ අල්ලාහ් පමණක් සත්‍ය දෙවියා වන බැවින්ය.

අල්ලාහ් දේවත්වයේ ගුණාංගවලින් අංග

සම්පූර්ණවෙයි. ඔහුට කිසිම අඩුපාඩුවක් හෝ දෝෂයක් නොමැත.

අල්ලාහ් නීති සම්පාදක කිරීමේ අයිතිය ඇත්තෙකි. ඔහුගේ මැවීම් සියල්ලටම ඔහුමය පීටත්වීමට අදාළ ක්‍රමයක් සකසා දුන්නා වෙයි. එහෙයින් අල්ලාහ්ට හෝ ඔහුගේ වක්තෘවරුන්ට එකඟ නොවන අන්දමින් කිසිවෙකුට තමන් වෙනුවෙන් හෝ වෙනත් අය වෙනුවෙන් නීති සම්පාදක කළ නොහැක.

තවද, කිසිවෙකු තනි පුද්ගලයකුට හෝ සමූහයකට හෝ නැමදීමේ ක්‍රමයක්, වෙනත් කටයුතු පිණිසවූ ක්‍රමයක් හෝ සම්පාදනය කිරීම නොකළ යුතුයි. එමෙන්ම යම් දෙයක් යහපත් බව හෝ අයහපත් බව හෝ තම නැමැත්ත අනුව කීමේ අයිතිය කිසිවෙකුට නැත. අල්ලාහ්ට මුළුමනින්ම සතුවූ දඩුවම් සඳහාවූ නීති සම්පාදනය කිරීමෙහි තවත් කෙනෙකු ඇඟිලි ගැසීමට කිසිම අයිතියක් නැත. කවුරුන්හෝ තමන් වෙත එම අයිතීන් පවරා ගන්නේද එය වනාහි ඔවුන් තමන්ව අල්ලාහ්ගේ ස්ථානයට ගෙන ඒමේ වෑයමකි. කවුරුන් එවැන්නන්ට කීකරුවී ක්‍රියා කරන්නේද ඔවුන් අල්ලාහ් වෙනුවට ඔවුන්ට දේවත්වය දී දෙවියන් බවට පිළිගන්නා වෙයි.

ක්‍රිස්තියානීන් තම විද්වතුන් හා පාදිළිවරුන් තමන්ගේ දෙවියන් බවට පිළිගත් බව අල්ලාහ් පවසා ඇත. මෙය මෙලෙසවූයේ ඔවුන් අල්ලාහ් අනුමත කළදේ තහනම් කර, ඔහු තහනම් කළ දේ ඔහුගේ අනුමැතිය නොමැතිව අනුමත කිරීමෙන්ය. ඔවුන් මෙය නොදැනුවත්ව කළා

නොවේ. අල්ලාහ් පමණය එකම දෙවියා බවත්, ඔහුට පමණනය නැමදීම කළයුතු බවත්, අල්ලාහ් අනුමත කරන්නේ ඔහු හා ඔහුගේ වක්තෘතුමා විසින් පෙන්වාදී ඇති ක්‍රමය අනුවවූ නැමදීම ක්‍රම අනුව නැමදීම ඉටු කළොත් පමණය යනු බවත් දැනගැනය ඔවුන් මෙසේ ක්‍රියා කළේ.

මෙම නිසා අල්ලාහ්ට පමණක් අපේ වැදුම පිදුම තබාගැනීම පිණිස ඒ ගැන මනාව වටහා ගැනීම අවශ්‍යවේ. මෙ දේ ගැන අපි ලබාගන්නා දැනුම තුළින් අපට මවා ඇත්තේ ඔහුට පමණක් අවනතාවී නැමදීමට බව අපට වැටහෙනු ඇත. අල්ලාහ් විසින් මවනලද ජීවීන් අතරින් මිනිසාද කෙනෙකු බව වටහාගෙන, ඔහුට ළහාවෙන ක්‍රමයන් බව නැමදීමට අදාළ දේ සියල්ල සලකා තම ජීවිතය සම්පූර්ණයෙන්ම අල්ලාහ්ට යටහත් පහත්ව, කීකරුව තබාගැනීමට අධිෂ්ඨාන කරගත යුතුයි.

අල්ලාහ්ට අවනතාවීම යනු, කෙනෙකුගේ පෙනෙන, නොපෙනෙනදේ, මුවින් පිටවෙන හා ක්‍රියාවෙන් පිළිබිඹු වනදේ සියල්ල අල්ලාහ් ප්‍රිය කරන අන්දමින් තබාගැනීමය.

කලිමාවෙ මෙම කෙටි විවරණය දැනගෙන ඒ අනුව තම ක්‍රියාවන්හි යෙදීමට උවමනා අනෙකුත් කරුණු ගැනත් දැනගැනීම ඉතා අවශ්‍යවන්නේය.

**එම කරුණු මොනවාද?**

1. නැමදීම හා අවනතාවීම නියම දෙවිවූ අල්ලාහ්ට පමණි යන්න විශ්වාස කිරීමයි. ඔහු උතුම් ගුණාංගයන්ගෙන්

පරිපූර්ණය. භාර්යාවකගේ හා පුතකුගේ අවශ්‍යතාවයන්
ගෙන් ඔහු නිර්දෝෂය. ඔහුට එවැනි අවශ්‍යතාවයක් කිසිවක් නොමැත යනු විශ්වාස කිරීමයි.

2. අල්ලාහ් ලොව ඇති සියල්ල මැවූවකි, පාලනය කරන්නෙකි; ජීවිතය හා මරණය ගැන දෙන්නෙකි; විශ්වයේ අධිපතියා ඔහු පමණය; ලොව පාලකයා හා නීති සම්පාදකයා ඔහු පමණය යනු විශ්වාස කිරීම.

3. පරිපූර්ණ ගුණාංගවලින් අල්ලාහ් සමන්විත බව විශ්වාස කිරීම. කුර්ආනයේ හා මුහම්මද් (සල්) තුමාගේ සුන්නාහ් (වදන්, ක්‍රියාවන් හා අනුමත කළදේ) වෙහි සදහන් වන පරිදි අල්ලාහ් කිසිම අඩුපාඩුවක් නොමැත්තෙකි. අල්ලාහ්ගේ ගුණාංග ගැන අප දැනගන්නේ මෙම මූලාශ්‍ර දෙකෙන් පමණකි. මුහම්මද් (සල්) තුමා අල්ලාහ් ගැන අසත්‍ය කරුණු ගෙන දැක්වූයේ නම් අල්ලාහ් නොවරදවාම එතුමාට දඩුවම් දෙනු ඇත. නමුත් අල්ලාහ් එතුමාට ප්‍රාතිහාර්ය පෑමේ සහාය දීමතුළින් එතුමා අල්ලාහ් ගැන සත්‍ය තොරතුරු දැක්වූ බව සහතිකවෙයි.
අල්ලාහ් පවසයිඃ

"ඔහු ( මුහම්මද් තුමා ) අපගැන බොරුවක් ගොතා කිවවේනම් අප ඔහුගේ ප්‍රාණ නහරයද කපා දමමු"
(අල් කුර්ආන් - 64: 44-46)

4. විශ්වාස වන්තයන් තම මිතුරන් බව පිළිගෙන ඔවුන්ට ආදරය දක්වා උදව් උපකාර කළ යුතුය.

අල්ලාහ් පවසයි:

**"මුහම්මද් අල්ලාහ්ගේ වක්තෘවරයාය. ඔහු සමග සිටින අය විශ්වාස නොකරන්නවුන් කෙරෙහි ඉතා දැඩිය. ඔවුහු තමන් අතර ඉතා දයාන්විතය.**

**(අල් කුර්ආන් - 48 : 29)**

**5. විශ්වාසවන්ත නොවන අයගෙන් කිසිම සම්බන්ධයක් නොමැතිව ඈත්ව සිටීම:**

අල්ලාහ් පවසයි:

**"ඉබ්රාහීම් හා ඔහු සමග සිටියවුන්ගෙන් නියත වශයෙන් ඔබට ලක්ෂණ ආදර්ශයක් ඇත. ඔවුන් තමන්ගේ සමාජයේවූවන්ට 'අපි ඔබගෙන්ද, අල්ලාහ් හැර ඔබ නමදින (අනෙක්) දෙවියන්ගෙන්ද නියත වශයෙන් වෙන්වූවෙමු. ඔබද අපි ප්‍රතික්ෂේප කළෙමු. ඔබ එකම අල්ලාහ් විශ්වාසය කරනතෙක් අපටත් ඔබටත් අතර සතුරුකමද, වෛරයද සදාතනිකවිය.' යනු කීවෝය.**

**(අල් කුර්ආන් - 60 : 4 )**

ඉස්ලාමයේ පදනම වන කලිමාව විශ්වාස කිරීමෙහි ලා මෙම අවශ්‍යතාවයන් අනිවාර්ය වන්නේය. මෙම කලිමාව විශ්වාස කර ඒ අනුව ක්‍රියා කරනවිට එයින් ලැබෙන ප්‍රතිඵලය නම් අල්ලාහ්ගේ තෘප්තියතුළින් ජන්නත් නම්වූ ස්වර්ගය ලබාගැනීමය. යමෙකු පාප ක්‍රියාවන්හි යෙදී අල්ලාහ්ගේ සමාව නොලද මරණයට පත්වන්නේනම් ඔහු ගැන අල්ලාහ් තීරණයක් ගනු ඇත. සමහරවිට ඔහුට සමාව ලැබෙයි. නැත්නම් අපාය ගින්නෙන් දඬුවම් දෙනු ලෙබේ. නමුත් පව්වලට නයි දඬුවම දී ඔහු පිවිතුරුවූ පසු අපා ගින්නෙන් මුදා ස්වර්ගයට ඇතුල් කරනු ලබන්නේය.

නබි මූසා (අලෙයි) තුමා තමන් වෙත නැමදීමේ යමක්, විශේෂයෙන් තමාට ඉටු කිරීමට එවැන්නක් ඉල්ලාසිටි විට අල්ලාහ් කී දේ එතුමාගේ වදන්හි සදහන් වෙයි.

අල්ලාහ් මෙසේ අණ කළබව සදහන් වෙයිඃ

**"මූසා, අල්ලාහ් හැර වැදුම් පිදුම් ලැබීමට තවත් කෙනෙකු නැති බව කියන්න"**

එවිට නබි මූසා "මගේ රබ් (අධිපති) ඔබගේ වහලුන් සියල්ලෝම මෙයට සාක්ෂි දරති "යනු කීහ. පසුව එම කලිමාවේ උත්තරීතරය පෙන්වා දීමට, අල්ලාහ් **"මූසා. අහස් හතද, භූමි හතද, ඒවාතුළ ඇති සියලු දේම තරාදියක එක් පැත්තක දමා අනෙක් පැත්තේ මෙම කලිමාව දැමුවහොත් එය ඒ සියල්ලටම වඩා බරවෙයි."** යනු කීවේය.

නබි (සල්) තුමා මෙසේ පැවසූහඃ

**"කවරෙකු කලිමාව තමාගේ අන්තිම වචනයක් ලෙස කියමින් මරණයට පත්වේද ඔහු ජන්නතයට ඇතුල් කරනු ලබන්නේය."**

## <u>මෙම විශ්වාසිත කලිමාව පහත සදහන් කොන්දේසීන්ගෙන් සමන්විත විය යුතුයිඃ</u>

1. ඥානයඃ අල්ලාහ් පමණය එකම දෙවි කෙනෙකි යනු පිළිගෙන ඔහුට පමණය නැමදීම කලයුත්තේ යන්නත් පිළිගත යුතුයි. තවද, අල්ලාහ් හැර වෙනත් බොරු දෙවියන් ඇදහීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළයුතුයි. බොරු දෙවියන්ට යහපතක් හෝ, අයහපතක් කිරීමට

ශක්තියක් නොමැත.

2. අල්ලාහ් ගැනවූ විශ්වාසයෙහි කිසිම සැකයක් නොතිබිය යුතුයි. එය ස්ථිර එකක් විය යුතයි.

3. මෙම කලිමාවට අයත් කොන්දේසි සියල්ල සම්පූර්ණයෙන් පිළිගත යුතුයි.

4. අවනතාවීම: කලිමාවට අදාල කොන්දේසි සියල්ල, අල්ලාහ් එකම අධිපතියාය. මුහම්මද් (සල්) තුමා ඔහුගේ වක්තෘවරයාය, යන්න අවනතාවීමෙන් හා සිය කැමැත්තෙන් පිළිගැනීමෙන් සම්පූර්ණ කළයුතුයි.

5. එයට අදාළ අවශ්‍යතාවයන් සියල්ල අවංකවම ඉටු කළ යුතුයි.

6. අල්ලාහ්ට පමණක් වැඳුම පිදුම කිරීමෙහි කීකරු ලීලාවෙන් හා අවනතභාවයෙන් අවංකව ඉටු කළ යුතුයි.

7. අල්ලාහ්ට, අල්ලාහ්ගේ වක්තෘ මුහම්මද් (සල්) තුමාට, අල්ලාහ්ට ආත්ම පරිත්‍යාගයෙන් අවනතවන්නන්ට හා ඔහුට කීකරුවන්නන්ට ආදරය කළ යුතුයි.

අවසානයෙන්, අල්ලාහ් අණකළදේ කිරීමෙනුත්, ඔහු තහනම් කළ දෙයින් වැළකීමෙනුත් ඔහුට කීකරු විය යුතු බව අපි තරයේ සිතා ගත යුතුයි. අල්ලාහ්ට කීකරුවීම වනාහි ඔහුට ආදරය කිරීමෙන්ද ඔහුගේ දඬුවම්වලට බියවීමෙන්ද, ඔහුගේ තිළින ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් ද, ඔහුගේ සමාව ඉල්ලීමෙන් ද, අවසාන වක්තෘවූ මුහම්මද් (සල්) තුමාගේ දේශන පිළිගෙන එතුමාගේ ෂරීආ නම් ආගමික නීති රීති අනුව පිවත්වීමෙන්ද ලබාගත යුතුයි. -ෂරීආ- වෙහි සියලුම උතුම් දේ සම්පූර්ණයෙන් අඩංගුවී ඇත.

ඉහත සදහන් විවරණය හා කොන්දේසි ලාඉලාහ ඉල්ලල්ලාහ් නම් කලිමාවට අයත්වේ.

අල්ලාහ් මෙම විවරණයෙන් අපට ප්‍රයෝජන කරත්වා යනුද, ඔහුගේ දාසයා හා වක්තෘ මුහම්මද් (සල්) තුමාටත්, එතුමාගේ පවුලේ අයටත්, හිත මිතුරන්ටත් ශාන්තිය හා සමාදානය ලැබෙවා යනුද ප්‍රාර්ථනා කරමු.

******************************

# المكتب التعاوني للدعـــوة والإرشـــاد

## في منطقة البطحـــاء



ص.ب: ٢٠٨٢٤ الرياض ١١٤٦٥

هاتف: ٤٠٣٠٢٥١ - ٤٠٣٠١٤٢ - ٤٠٣٤٥١٧ - ٤٠٣١٥٨٧

فاكس: ٤٠٥٩٣٨٧



تحت إشـــراف

وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد



حقوق الطبع محفوظة للمكتب

لا يسمح بطبع أي جزء من هذا الكتاب إلا بعد موافقة خطية مسبقة من المكتب

ح المكتب التعاوني للدعوة والإرشاد بالبطحاء، ١٤١٦هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

اللاحم، حمود بن لاحم

معنى لا إله إلا الله / ترجمة محمد سليم لبي

١٦ ص ؛ ١٢X١٧ سم

ردمك: ٠-٢٤-٧٩٨-٩٩٦٠

١- التوحيد ٢- العقيدة الإسلامية

أ- لبي، محمد سليم (مترجم)

ب- العنوان

ديوي ٢٤٠ ١٦/٠٦٦٧

رقم الإيداع: ١٦/٠٦٦٧

ردمك: ٠-٢٤-٧٩٨-٩٩٦٠

# معنى لا إله إلا الله

باللغة السنهالية

تأليـــف

حمود بن محمد اللاحم

ترجـــمة

محمد سليم لبي

مطابع الحميضي
تلفون: ٤٥٨١٠٠٠ - فاكس: ٤٥٩٢٢١٧

# معنى لا إله إلا الله

## باللغة السنهالية

تأليف

**حمود بن محمد اللاحم**

ترجمة

**محمد سليم لبي**


برنامج

**وفرعها في السماء**

دعوة للمساهمة في دعم

خمسة أنشطة للمكتب

**بمبلغ خمسين ريال**

توزع كالتالي :

١٠
كفالة داعية

١٠
رحلات تعليمية

١٠
صدقة جارية

١٠

١٠

٥٣

**للمساهمة في البرنامج**

الايداع في الحساب رقم ٤/ ٦٣٩٠ فرع ١٨٥ الراجحي وارسال صورة الإيداع على فاكس المكتب : ٤٠٥٩٣٨٧

أو التكرم بالحضور إلى مقر المكتب أو التحويل عن طريق المصرف الآلي إلى الحساب رقم ١٨٥٠٠٦٣٩٠٤



المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالبطحاء

تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد

هاتف : ٤٠٣٠٢٥١ - فاكس : ٤٠٥٩٣٨٧ - ص.ب ٢٠٨٢٤ - الرياض ١١٤٦٥